# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2355/09 - 2023 ඔක්තෝබර් මස 23 වැනි සඳුදා - 2023.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(2) ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් පහත උපලේඛනයේ සඳහන් විෂයයන් හා කාර්යයන්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන සහ ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත් 2023 ඔක්තෝබර් මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා වෙත පැවරීම නිශ්චය කරනු ලැබ ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

*අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. රාජ්‍ය වැවිලි ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ II තීරුවෙහි දැක්වෙන ආයතන වලට අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම තුළින් ඒවායේ ඵලදායීතාවය සහ එම ආයතන විසින් උත්පාදනය කරනු ලබන ආදායම් ඉහළ නැංවීම<br>5. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>6. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | 1. ජනතා වතු සංවර්ධන මණ්ඩලය<br>2. සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව<br>3. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව<br>4. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම<br>5. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම<br>6. සීමාසහිත හලාවත වැවිලි සමාගම | • ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත (1958 අංක 04)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි II තීරුවේ සඳහන් ආයතන වලට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

EOG 10 - 0253

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.